# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## විවාහ ලියාපදිංචි කිරීමේ (සංශෝධන)

**(112 වන අධිකාරය වූ) විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා විසින්
2013 මාර්තු මස 08 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2013 පෙබරවාරි මස 26 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

**[224 වන පනත් කෙටුම්පත]**


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 6.00 යි** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

*2 වන වගන්තිය :* මේ වගන්තිය මගින් කොට්ඨාස රෙජිස්ට්‍රාර්වරයා සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා වෙත ගාස්තු ගෙවීමේ ක්‍රමය නිශ්චිතව දක්වමින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (112 වන අධිකාරය වූ) විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 24 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

*3 වන වගන්තිය :* මේ වගන්තිය මගින් දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා වෙත ගෙවිය යුතු ගාස්තු මුදල් ප්‍රතිශෝධනය කිරීම මගින් සහ ගෙවීමේ ක්‍රමය නිශ්චිතව දක්වමින් ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

*4 වන වගන්තිය :* මේ වගන්තිය මගින් රෙජිස්ට්‍රාර්වරයා වෙත ගෙවිය යුතු ගාස්තු නිශ්චිතව දක්වමින් ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

*5 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ගෙවිය යුතු ගාස්තු ප්‍රතිශෝධනය කරමින් සහ ගෙවීමේ ක්‍රමය නිශ්චිතව දක්වමින් ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

*6 වන වගන්තිය :* මේ වගන්තිය මගින් මුද්දර ඇලවීම වෙනුවට මුදලක් ගෙවනු ලැබිය යුතු බවට ඉල්ලුම්කරු වෙත නියම කරමින් ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

*7 වන වගන්තිය :* මෙම වගන්තිය මගින් ගැසට් පත්‍රයේ පළකරනු ලබන රීති මගින් දෙවන උපලේඛනයේ සඳහන් පරිදි ගාස්තු ප්‍රතිශෝධනය කිරීම සඳහා අමාත්‍යවරයාට බලය ලබා දෙමින් ප්‍රධාන ප්‍රඥප්තියේ 62 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

*8 වන වගන්තිය :* මේ වගන්තිය මගින් මේ පනතේ දෙවන උපලේඛනය ප්‍රතියෝජනය කරනු ලැබේ.

එල්. ඩී.—ඕ. 6/2013

**(112 වන අධිකාරය වූ) විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 2013 අංක දරන විවාහ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, 2013 ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වන ලෙස සලකනු ලැබිය යුතුය.

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මකවීමේ දිනය.

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (112 වන අධිකාරය වූ) විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 24 වන වගන්තියේ (6) වන උපවගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(112 වන අධිකාරය වූ) විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 24 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(6) 23 වන වගන්තියේ (1), (2) හෝ (3) වන උපවගන්තිය යටතේ හෝ එහි (4) වන උපවගන්තිය යටතේ යම් කොට්ඨාසයක රෙජිස්ට්‍රාර්වරයකු හෝ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයකු වෙත කරනු ලබන සෑම නිවේදනයක් සමගම, පිළිවෙලින් රුපියල් දහයක හෝ රුපියල් තිහක නැතහොත් අමාත්‍යවරයා විසින් කලින් කලට නියම කරනු ලබන වෙනත් යම් මුදලක් ගෙවීම ඔප්පු කිරීම සඳහා වූ අවස්ථාවෝචිත පරිදි, එම කොට්ඨාසයේ රෙජිස්ට්‍රාර්වරයා හෝ එම දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා විසින් නිකුත් කරන ලද ලදුපතක් ද ඉදිරිපත් කළ යුතු ය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තියේ (4) වන උප වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(4) දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා ඉදිරියේ දී ප්‍රකාශය කරනු ලබන අවස්ථාවක දී, එම ප්‍රකාශය කරනු ලබන පාර්ශ්වය විසින් රුපියල් සියයක් හෝ අමාත්‍යවරයා විසින් කලින් කල නියම කරනු ලබන යම් මුදලක් ගෙවනු ලැබිය යුතු අතර යම් කොට්ඨාසයක රෙජිස්ට්‍රාර්වරයා ඉදිරියේදී ප්‍රකාශය කරනු ලබන අවස්ථාවක දී, එම ප්‍රකාශය සමග රුපියල් සියයක් හෝ නියම කරනු ලබන වෙනත්

2—PL 007045—1,500 (2013/03)

යම් මුදලක් ගෙවීම සඳහා වූ සාක්ෂියක් වශයෙන් දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා විසින් නිකුත් කරනු ලබන ලදුපතක් ද ඉදිරිපත් කළයුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය සංශෝධනය කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තියේ (5) වන උප වගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන උප වගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

“(5) විවාහය සිදු කිරීමේ දින සිට දින හතක කාලයක් ඇතුලත දේවගැතිවරයා විසින් එම විවාහයේ අනු පිටපත විවාහ රෙජිස්ටරයෙන් ඉවත්කර, එම විවාහය ලියාපදිංචි කිරීම සඳහා එම රෙජිස්ට්‍රාර්වරයා වෙත ගෙවිය යුතු බවට අමාත්‍යවරයා විසින් කලින් කල නියමකරනු ලැබිය හැකි වුව ද, මේ පනතේ දෙවන උප ලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ගාස්තුවක් සමග විවාහය සිදුකල දිස්ත්‍රික්කය ඇතුළත සිටින එම දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා වෙත එකී අනුපිටපත යවනු ලැබිය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය සංශෝධනය කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන උප වගන්තිය ආදේශකිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(2) ඉහතින්ම වූ උප වගන්තියේ විස්තර කර ඇති පන්තියකට හැර, ස්ත්‍රී පාර්ශ්වය යම් පන්තියකට අයත්වන අවස්ථාවක දී හෝ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයාගේ මතය අනුව එම උප වගන්තියේ ප්‍රතිලාභ සඳහා හිමිකම් නොලබන අවස්ථාවක දී, විවාහ වීමට අදහස් කර සිටින එක් පාර්ශ්වයක් විසින් ඉල්ලීමක් කිරීමෙන් පසුව සහ රුපියල් තුන්දහස් පන්සියයක මුදලක් හෝ අමාත්‍යවරයා විසින් කලින් කල නියම කරනු ලැබිය හැකි යම් මුදලක් ගෙවීමෙන් පසු ඒ පිළිබඳ සාධකයක් වශයෙන් දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා විසින් නිකුත් කරනු ලබන ලදු පතක් ද සමග මෙම බලපත්‍රයේ නම් සඳහන් ස්ථානයේදී සහ පාර්ශ්ව විසින් කැමැත්ත දක්වනු ලබන වේලාවක දී විවාහය සිදුකිරීම සඳහා රෙජිස්ට්‍රාර්වරයකු වෙත, දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් විසින් බලය ලබාදෙන අවසර පත්‍රයක් නිකුත් කිරීම නීත්‍යානුකූල වන්නේ ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තිය සංශෝධනය කිරීම.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන උප වගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(2) සෑම ලිඛිත ඉල්ලීමක්ම සහ එහි සෑම සහතික පිටපතක් හෝ සහතික කරන ලද උද්ධෘතයක් ලබා ගැනීම සම්බන්ධයෙන්

අමාත්‍යවරයා විසින් කලින් කල නියම කරනු ලබන යම් මුදලක් ඉල්ලුම්කරු විසින් ගෙවනු ලැබිය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 62 වන වගන්තිය සංශෝධනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 62 වන වගන්තියේ (1) වන උප වගන්තියේ “දෙවන උපලේඛනයේ සඳහන් ගාස්තු” යන වචන වෙනුවට “අමාත්‍යවරයා විසින් කලින් කල නියම කරනු ලැබිය හැකි දෙවන උපලේඛනයේ සඳහන් ගාස්තු” යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියට දෙවන උපලේඛනය ප්‍රතියෝජනය කිරීම.

8. 2006 අංක 36 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය මෙයින් ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කරනු ලැබේ :-

(62 වන වගන්තිය)

“දෙවන උපලේඛනය

| | කුමන කාර්ය සඳහා ද යන වග | ගෙවිය යුත්තේ කාටද යන වග | ගෙවනු ලබන්නේ කවුරුන් විසින් ද යන වග | මුදල<br>රු. ශත |
|---|---|---|---|---|
| 1 | ඔහුගේ කාර්යාලයේ දී හෝ වෙනත් යම් ස්ථානයක දී විවාහ දැන්වීමක් ඇතුළත් කිරීම. | රෙජිස්ට්‍රාර්වරයාට | අයදුම්කරු | 100.00 |
| 2 | ඔහුගේ කාර්යාලයේ දී හෝ වෙනත් යම් ස්ථානයක දී විවාහ දැන්වීමක් ඇතුළත් කිරීම. | අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයාට හෝ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයාට | අයදුම්කරු | 100.00 |
| 3 | විවාහ දැන්වීමක් පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයාගේ සහතිකය නිකුත් කිරීම. | රෙජිස්ට්‍රාර්වරයාට | විවාහ පාර්ශ්වයන් | 100.00 |
| 4 | විවාහ දැන්වීමක් පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයාගේ සහතිකය නිකුත් කිරීම. | අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයාට හෝ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයාට | විවාහ පාර්ශ්වයන් | 100.00 |

| කුමන කාර්ය සඳහා ද යන වග | ගෙවිය යුත්තේ කාටද යන වග | ගෙවනු ලබන්නේ කවුරුන් විසින් ද යන වග | මුදල රු. ශත |
|---|---|---|---|
| 5 ඔහුගේ කාර්යාලයේ දී විවාහය සිදු කිරීම | රෙජිස්ට්‍රාර්වරයාට | විවාහ පාර්ශ්වයන් | 750.00 |
| 6 ලියාපදිංචි ප්‍රසිද්ධ පූජනීය ස්ථානයක දී සිදු කරන ලද විවාහයක් ලියාපදිංචි කිරීම | දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයාට | විවාහ පාර්ශ්වයන් | 750.00 |
| 7 ඔහුගේ කාර්යාලයේ දී විවාහය සිදු කිරීම | අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයාට හෝ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයාට | විවාහ පාර්ශ්වයන් | 1500.00 |
| 8 38 වන වගන්තිය යටතේ ඔහුගේ කාර්යාලයෙන් පිටත දී විවාහයක් සිදු කිරීම | රෙජිස්ට්‍රාර්වරයාට | විවාහ පාර්ශ්වයන් | 1500.00 |
| 9 38 වන වගන්තිය යටතේ ඔහුගේ කාර්යාලයෙන් පිටත දී විවාහයක් සිදු කිරීම | අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයාට හෝ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයාට | විවාහ පාර්ශ්වයන් | 1500.00 |

වලංගුභාවය සහ හානිපූරණය.

**9.** 2013 ජනවාරි මස 1 වන දින සිට ආරම්භව 2013 මාර්තු මස 31 වන දිනයෙන් අවසන්වන කාලය දක්වා අයකිරීම සඳහා හෝ එකතු කිරීම සඳහා මේ පනත මගින් බලය දී ඇති යම් කාර්යයක් සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් හෝ ඔහු වෙනුවෙන් නැතහොත් මේ පනත යටතේ බලය පවරන යම් තැනැත්තකු විසින් අයකරනු ලබන හෝ එකතු කරනු ලබන යම් ගාස්තු රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් හෝ මේ පනත යටතේ බලය පවරන ලද වෙනත් යම් තැනැත්තකු විසින් වලංගු ලෙස අය කරනු ලැබ හෝ එකතු කර ඇති ලෙස සලකනු ලැබිය යුතු යඃ

එසේ වුව ද, මේ වගන්තියේ ඉහත කී විධිවිධාන, ඉහත කී කාලසීමාව තුළ දී අයකරනු ලබන හෝ එකතු කරනු ලබන ගාස්තු සම්බන්ධයෙන් යම් අධිකරණයක් විසින් කරනු ලබන තීරණයකට හෝ නියෝගයකට නැතිනම් යම් අධිකරණයක විභාග වෙමින් පවත්නා නඩු කටයුතු සඳහා බල නොපෑ යුතු ය.

**10.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත්,එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.